# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

යොමු අංකය : පු.වි.1/1/බ.ගැ. පරිපාටි දිනය : 2011.09.28

1.2 අමාත්‍යාංශය : අධ්‍යාපන අමාත්‍යාංශය

යොමු අංකය : NH/1/8/2/28 (X) දිනය : 2013.01.10

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම.

යොමු අංකය : DMS/CO4/29-02 දිනය : 2010.11.23

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමු අංකය : EST-2/RECRU/04/2398 දිනය : 2013.03.04

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : NSCC/4/29/2/SR-2 දිනය : 2013.09.02

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/02-01-29/12/2013 දිනය : 2015.03.31

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : III ,II, I

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

දෙපාර්තමේන්තුවේ රසායන විද්‍යාත්මක ක්ෂේත්‍ර තුළ නම් කර ඇති ජීව විද්‍යා, රසායන විද්‍යා, භෞතික විද්‍යා, ගණිතය හා කෘෂිකර්මය යන විද්‍යාත්මක උපදේශන සේවාවන් සැපයීම, සංවර්ධනය, පරිපාලන කටයුතු සිදු කිරීම සහ විද්‍යාත්මක ව්‍යාපෘති කළමනාකරණය.

3.4 කාර්යයන් පැවරීම :

" ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාවය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක."

04. තනතුරෙහි/තනතුරු වල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL -1 -2006

5.2 වැටුප් පරිමාණය : රු.22935–10x645-8x790-17x1050- 53

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | 01 | රු. 22935/- |
| II | 12 | රු. 30175/- |
| I | 20 | රු. 36755/- |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| 1. අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) | I | 01 | 1. ශ්‍රී ලංකාව පුරා විසිරී පවතින චංචල හා නිශ්චල පුරාවස්තු රසායනික ක්‍රම හෝ යාන්ත්‍රික ක්‍රම උපයෝගි කර ගනිමින් සංරක්ෂණය කිරීම.<br>2. ඒ සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම හා ක්‍රම උපායන් වැඩි දියුණු කිරීම.<br>3. සංරක්ෂණය සම්බන්ධව ඇති විදේශීය හා දේශීය ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම, අදහස් හුවමා කර ගැනීම.<br>4. සංරක්ෂණ ක්‍රියාවලිය නවීන විද්‍යානුකූලව පවත්වා ගෙන යාම.<br>5. ශ්‍රී ලංකාව පුරා ඇති නිශ්චල හා චංචල පුරාවස්තු ගවේෂණය කිරීම, සංගණනය කිරීම, වාර්තා එක්රැස් කිරීමට උපදෙස් ලබාදීම හා ඒ සඳහා මගපෙන්වීම.<br>6. රසායන ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමේදී ඒවායේ තත්වය පිළිබඳ අධීක්ෂණ මට්ටමින් සහයෝග දැක්වීම හා උපදෙස් ලබාදීම.<br>7. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |

| | | | |
|---|---|---|---|
| 2.නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) | II/III | 02 | 1. ශ්‍රී ලංකාව පුරා විසිරී පවතින පෞරාණික වංවල හා නිශ්වල වර්ණක පෘෂ්ඨයන් සංරක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) ට සහාය දැක්වීම.<br>2. ඒ සඳහා අවශ්‍ය ක්‍රම උපායන් වැඩි දියුණු කිරීම හා නව සොයා ගැනීම් සඳහා දේශීය පර්යේෂණ පැවැත්වීම. අදාල ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.<br>3. රසායන ද්‍රව්‍ය හා උපකරණ ලබාගැනීමේදී අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) ට සහාය දැක්වීම.<br>4. වාර්තා, ව්‍යාපෘති යෝජනා හා ඇස්තමේන්තු සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.<br>5.වර්ණක පෘෂ්ඨ සංරක්ෂණය කිරීම පිළිබඳව සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.<br>6. බිතුසිතුවම් ගවේෂණය, සංරක්ෂණය කිරීම හා වාර්තා තබාගැනීම.<br>7. ශ්‍රී ලංකාව පුරා පැතිරී පවතින නිශ්වල හා වංවල පුරාවස්තු රසායනික ක්‍රම හෝ යාන්ත්‍රික ක්‍රම මගින් සංරක්ෂණය කිරීම හා ඒ සඳහා අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) ට සහයෝගය දැක්වීම.<br>8. පුරාවස්තු සංරක්ෂණය කිරීමේ ක්ෂේත්‍ර රාජකාරී වලදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.<br>09. සංරක්ෂණ සඳහා අවශ්‍ය රසායන මිශ්‍රණ සකස් කිරීමට උපදෙස් ලබාදීම.<br>10. කෞතුකාගාර වල පුරාවස්තු, කැණීම් මගින් ලැබෙන පුරාවස්තු හා අහඹු ලෙස ලැබෙන පුරාවස්තු සංරක්ෂණය කිරීමේ වගකීම දැරීම.<br>11. පුරාවස්තු සංරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය ආයතන සම්බන්ධව කටයුතු කිරීම, ඒ සඳහා පර්යේෂණ පැවැත්වීම, නව සොයා ගැනීම කෙරෙහි යොමු වීම හා වැඩි දියුණු කිරීම.<br>12. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) - 01

නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) - 02

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50 % |
| සීමිත | 50 % |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිග... විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්,

(අ) රසායන විද්‍යාව පිළිබඳ 1 පෙළ හෝ 2 පෙළ සාමාර්ථයන් සහිත විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) රසායන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සමග රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(ඇ) රසායන විද්‍යාව විෂයයක් ලෙස ඇති උපාධියක් සමග රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විවෘත තරග විභාගයකට දෙවතාවකට වඩා පෙනී නොසිටීම.

iv. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන අයකු නොවීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/3 හා 2009.02.20 දාතම දරන කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ සඳහන් කරුණු අනුව නුසුදුස්සකු නොවීම.

vi. අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 22

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 28

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී අපේක්ෂිතයන්ට ලබාදුන් ලකුණු ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු වලට එකතු කල විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40% |

විෂය නිර්දේශය ඇමුණුම 01 හි දැක්වේ.

7.2.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

ඉටු කර ගනු ලැබීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන සුදුසුකම හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : අදාළ නොවේ.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : (ඇමුණුම 03)

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන පන්තියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියෙකු වීම හෝ විශේෂ පන්තියේ නිලධාරියෙකු වීම.

7.3.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත්

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සීමිත තරඟ විභාගයකට දෙවතාවකට වඩා පෙනී නොසිටීම.

iv. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

v. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ අයකු නොවීම.

vi. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දාතම දරන කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ සඳහන් කරුණු අනුව නුසුදුස්සකු නොවීම.

vii. අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් සමත් අදාළ සුදුසුකම සම්පූර්ණ කරන අපේක්ෂකයන්ගේ ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණ මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී අපේක්ෂිතයන්ට ලබාදුන් ලකුණු ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු වලට එකතු කල විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | 100 | 40% |
| 2. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |

විෂය නිර්දේශය ඇමුණුම 02 හි දැක්වේ.

7.3.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

ඉටු කර ගනු ලැබීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන සුදුසුකම හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් සමත් අදාළ සුදුසුකම සම්පූර්ණ කරන අපේක්ෂකයන්ගේ ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණ මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී අපේක්ෂිතයන්ට ලබාදුන් ලකුණු ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු වලට එකතු කල විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | 100 | 40% |
| 2. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |

විෂය නිර්දේශය ඇමුණුම 02 හි දැක්වේ.

7.3.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

ඉටු කර ගනු ලැබීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන සුදුසුකම හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීම සඳහා

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : අදාළ නොවේ.

7.3.4.4 : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. |
| අතිරේක සේවා කාලය සඳහා | 35 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| පරිගණක හැකියාව | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන:

1. ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී අපේක්ෂිතයන්ට ලබාදුන් ලකුණු ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු වලට එකතු කළ විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

2. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම හා වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම මඟින්

7.4 කුසලතා මත බඳවා ගැනීමේ ක්‍රමය : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව ලිඛිත පරීක්ෂණය (විෂය නිර්දේශය ඇමුණුම 04 න් දැක්වේ.) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ නිබන්ධනයක් (විෂය නිර්දේශය ඇමුණුම 05 න් දැක්වේ.) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්වී වසර පහ (05) ක් ගතවීමට පෙර | දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති වාර්තාවක් (විෂය නිර්දේශය ඇමුණුම 06 න් දැක්වේ.) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

I වන කාර්යක්ෂමතා කඩඉම - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින්
II වන කාර්යක්ෂමතා කඩඉම
III වන කාර්යක්ෂමතා කඩඉම } පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින්

09. භාෂා ප්‍රවීණතාව : ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව

10. ශ්‍රේණි උසස් කිරීම් : ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව

11. තනතුරු වලට පත් කිරීම.

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| 01. අධ්‍යක්ෂ | සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. | නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව තෝරා පත් කෙරේ. |
| 02. සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | සේවයේ III ශ්‍රේණිය, II ශ්‍රේණිය ඉන් ඉහල ශ්‍රේණියක නිලධාරියෙකු වීම. | නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව තෝරා පත් කෙරේ. |

සටහන : සම ජ්‍යෙෂ්ඨත්වය ඇති විට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

12. මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන හා කොන්දේසි ද අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ

සක්‍රිය සේවා කාලයක් යනු : ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූති නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව වේ.

15. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන වලට අමතරව ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැතිව ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට සෑම නිලධාරියෙකුම යටත් වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ : අත්සන ..................................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : ඊ. ඒ. පී. ප්‍රසාද් චන්දන
පරිපාලන නිලධාරී
තනතුර : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ - 07
දිනය : 2016.02.05

පරීක්ෂා කලේ : අත්සන ..................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එන්.ඒ.එම්. විමලසේන
සහකාර අධ්‍යක්ෂ (පාලන)
තනතුර : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
දිනය : 2016.02. ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

නිර්දේශ කර ඉදිරිපත් කිරීම.

අත්සන ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර : ආචාර්ය සෙනරත් දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07
දිනය : 2016/02/17

යොමු අංකය : ED/05/93/01/01/34

පුරාවිද්‍යා අභ්‍යාසලාභී ශ්‍රී ලංකා විදුහල්පති සේවයෙහි ....... තනතුර සඳහා යෝජිත මෙම බඳවා

ගැනීමේ පටිපාටිය අනුමත කර නිර්දේශ කරමි.

අත්සන .......................................

නම : ඩබ්. එම්. බන්දුසේන

ලේකම් **ඩබ්ලිව්. එම්. බන්දුසේන**

අධ්‍යාපන ..................... ලේකම් ..................... අමාත්‍යාංශය
අධ්‍යාපන අමාත්‍යාංශය

දිනය : ..................... "ඉසුරුපාය" නිල මුද්‍රාව :
බත්තරමුල්ල.

---

යොමු අංකය : PSC/EST/02-01-29/12/2013

පුරාවිද්‍යා අභ්‍යාසලාභී ..... හි ශ්‍රී ලංකා විදුහල්පති සේවා ........ සඳහා වන ..................... මෙම

බඳවා ගැනීමේ පටිපාටිය 2015.03.31 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන

ලදී.

අත්සන .......................................

නම :

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

දිනය : 2016-04-20 නිල මුද්‍රාව :

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 % | 40% |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 % | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පවතින අවස්ථා වලදී පමණි.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය හා තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කර ඇති මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත. |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරයද ජාතික හා අන්තර් ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණුද ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති අවබෝධයද පරීක්ෂා කිරීම සඳහා සකස් වූ සාමාන්‍ය දැනුම මැනීමේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පත්‍ර කොටස් 02 කි. පළමු කොටස කෙටි ප්‍රශ්න වලින් සමන්විතය. ලකුණු 25 කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න 08 කින් 05 කට පිළිතුරු සැපයිය යුතුය. ලකුණු 75 කි. |

සකස් කලේ :
අත්සන ..............
නම : ජී. ඒ. ජී. ප්‍රසාද් ...
තනතුර : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ - 07
දිනය : 2016.02.25

පරීක්ෂා කලේ :
අත්සන ..............
නම : එන්.ජී.එම්. විමලසේන
තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ - 07.
දිනය : 2016 ...

අත්සන ..............
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..............
තනතුර : ..............
දිනය : 2016/02/17
නිල මුද්‍රාව : ආචාර්ය සෙනරත් දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07

ඇමුණුම 02

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය.

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 % | 40% |
| 2. බුද්ධි පරීක්ෂණය | පැය 02 | 100 % | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පවතින අවස්ථා වලදී පමණි.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. විශේෂ ප්‍රශ්න පත්‍රය | තනතුරෙහි ක්ෂේත්‍රට අදාළව දෙපාර්තමේන්තුවේ තිබෙන්නා වූ විශේෂිත කාර්යයන් පිළිබඳව දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, කාර්යයභාරය සහ සාමාන්‍ය පරිපාලනය පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීමට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.<br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය : බහුවරණ, කෙටි ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විත විය හැක. |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | I වන කොටස :සියළුම විෂයයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.<br>II වන කොටස : ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ කලාව යන විෂයයන්ද දේශීය හා විදේශීය කාලීන තොරතුරු සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.<br>ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය : ඉහත ප්‍රශ්න පත්‍ර බහුවරණ, කෙටි ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හෝ ඒවායේ සංකලනයෙන් යුක්ත විය හැක. |

සකස් කලේ :
අත්සන ..............................
නම : ටී. ඩී. පී. ප්‍රසාද් චන්දන
තනතුර : පරිපාලන නිලධාරී, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ - 07
දිනය : 2016.02.17

පරීක්ෂා කලේ :
අත්සන ..............................
නම : එන්.ඒ.එම්. විමලසේන
තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.
දිනය : 2016.02.17

අත්සන ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..............................
තනතුර : ..............................
දිනය : 2016/02/17
නිල මුද්‍රාව : ආචාර්ය සෙනරත් දිසානායක, අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07

01. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා විවෘත බඳවා ගැනීමට අදාල ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. |
| පර්යේෂණ නිබන්ධන හෝ ප්‍රකාශන සඳහා | 35 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| පරිගණක හැකියාව | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| **එකතුව** | **100** | |

සටහන :

1. ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී අපේක්ෂකයන්ට ලබා දුන් ලකුණු ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු වලට එකතු කළ විට ලැබෙන මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

2. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

03. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

සකස් කලේ :

අත්සන ..............................

නම : ..... ඊ. ඒ. ඊ. ප්‍රසාද් චන්දන

තනතුර : ............... පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

දිනය : ....2016. 02. ...... - 07

පරීක්ෂා කලේ :

අත්සන ..............................

නම : .............. එන්.ඒ.එම්. විමලසේන

තනතුර : .............. සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2016.02.05 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

අත්සන ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..............................

තනතුර : ..............................

දිනය : 2016/02/17

නිල මුද්‍රාව : ..... ආචාර්ය සෙනරත් දිසානායක අධ්‍යක්ෂ ජනරාල් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත කොළඹ 07

ඇමුණුම 04

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. මූල්‍ය ක්‍රම | පැය 01 | 100 % | 40% |
| 2. පරිපාලන | පැය 01 | 100 % | 40% |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය 01 | 100 % | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මූල්‍ය ක්‍රම | 1. පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්<br>(අ). ආණ්ඩුවේ මුදල් රෙගුලාසි, I වැනි කාණ්ඩය<br>(X වැනි පරිච්ඡේදය හැර)<br>(ආ). ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තු ඒවා සකස් කිරීම, ආදායම් හා වියදම් ශීර්ෂම හා විසර්ජන පනත මූල්‍ය පිළිබඳව |
| 2. පරිපාලනය | 1. පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්<br>(අ). ආයතන සංග්‍රහය පරිච්ඡේද<br>I, II, III, V, VI, VII, IX, XXIX, XXX, XXXIII, XLVII සහ XLVIII<br>(ආ). රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි | දෙපාර්තමේන්තු චක්‍රලේඛ, ස්ථාවර නියෝග, පුරාවිද්‍යා ආඥා පනත හා සංශෝධන සංස්කෘතික දේපල පනත පිළිබඳ අවබෝධය |

සකස් කලේ :
අත්සන ....................................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම :.................... පරිපාලන නිලධාරී
තනතුර : .............. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ - 07
දිනය : ...... 2016 ......

පරීක්ෂා කලේ :
අත්සන ....................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරයා)
නම : .................. එන්.ඒ.එම්. විමලසේන
තනතුර : .................. සහකාර අධ්‍යක්ෂ (පාලන) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
දිනය : 2016.02. ...... ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

අත්සන ....................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ....................................
තනතුර : ....................................
දිනය : 2016 /02 /17
නිල මුද්‍රාව : .................... ආචාර්ය සෙනරත් දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07

ඇමුණුම 05

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ශ්‍රේණිය සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. විෂය ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ නිබන්ධනයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ඇතුලත | 100 % | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

සකස් කලේ :
අත්සන ..........
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම :..........
තනතුර :.......... පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ - 07
දිනය : 2016. 02. 05

පරීක්ෂා කලේ :
අත්සන ..........
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : .......... එන්.ඒ.එම්. විමලසේන
තනතුර : .......... සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය : 2016. 02. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ - 07.

අත්සන ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..........
තනතුර : ..........
දිනය : 2016/02/17
නිල මුද්‍රාව : ..........
ආචාර්ය සෙනරත් දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07

01. විභාගයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා වන 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. විෂය ක්ෂේත්‍රයට අදාල ව්‍යාපෘති වාර්තාවක් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ඇතුලත | 100 % | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

සකස් කලේ :
අත්සන ......................................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරයා)
නම : ..................... ජී. ඒ. පී. ප්‍රසාද්
තනතුර : ..................... පරිපාලන නිලධාරී
දිනය : ..... 2016. ..... පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ - 07

පරීක්ෂා කලේ :
අත්සන ......................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : ..................... එන්.ජී.එම්. විමලසේන
තනතුර : ..................... සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය : 2016.02 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

අත්සන ......................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ......................................
තනතුර : ......................................
දිනය : 2016/02/17
නිල මුද්‍රාව : ..................... ආචාර්ය සෙනරත් දිසානායක, අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07